**පේරාදෙණිය විශ්වවිද්‍යාලය - 2022**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) හා 108(1) උපවගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

[[

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුයි.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂික සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු.1,871,888,168ක ස්ථාවර වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරිමට කටයුතු කර නොතිබුණි. | සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් 2023 වර්ෂයේ ප්‍රත්‍යාගණනය කිරීමෙන් අනතුරුව මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලබන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 19 ඡේදය ප්‍රකාරව විශ්වවිද්‍යාල පරිශ්‍රය තුල ඉදිකර ඇති මාර්ග පද්ධති, මළ ප්‍රවාහන පද්ධති, ජල නල හා සන්නිවේදන පද්ධති හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | විශ්වවිද්‍යාලය ආරම්භයේ දී විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ ඉදිකරන ලද ජල නල පද්ධති සහ මළ ප්‍රවාහන පද්ධති හඳුනා ගැනීම අපහසු කාර්යයක් වන අතර දැනට ඉදි කරමින් පවතින ජල නළ හා මළ ප්‍රවාහන පද්ධතීන් හඳුනාගෙන ඉදිරියේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 99(ඇ) වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාළව පශු වෛද්‍ය පීඨයේ හා කෘෂි විද්‍යා පීඨයේ ගොවිපළවලින් ලැබී තිබුණු රු.48,465,125 ක අලෙවි ආදායම් හා ඒ සඳහා වැය කළ රු.58,617,005 ක් විශ්වවිද්‍යාලයේ ආදායම් හා වියදම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වසරේ සිට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගොවිපල වෙනුවෙන් ලද ආදායම් සහ දැරූ වියදම් ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | විශ්වවිද්‍යාල පනතේ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසන් දින වන විට වැඩ අවසන් කර තිබුණු ගිවිසුම්ගත වටිනාකම රු.1,793,659,427 ක ප්‍රාග්ධන සහ පුනරුත්තාපන ව්‍යාපෘති 14 ක් දේපල පිරියත හා උපකරණ යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි . | මෙම ප්‍රාග්ධනිත හා පුනරුත්තාපන ව්‍යාපෘති 14 සමාලෝචිත වර්ෂය තුළ සම්පූර්ණයෙන් වැඩ අවසන් කළ බවට වාර්තා මූල්‍ය අංශයට ලැබී නොමැති බව. | සම්පූර්ණයෙන් වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති, දේපල, පිරියත හා උපකරණ යටතේ ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ අධ්‍යාපනය හදාරන විදේශීය සිසුන් 22 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයට අදාලව අයවිය යුතු රු.61,825,532 ක (USD 169,500) පාඨමාලා ගාස්තු ආදායම ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මෙය නිවැරදි කොට ආදායමක් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | විශ්වවිද්‍යාලයට ලැබිය යුතු සියලුම ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ 5.2.1 හා 5.2.2 යන ඡේදවලට අනුව සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම්වලින් විශ්වවිද්‍යාලයට ලැබිය යුතු රු.66,579,267 ක් හඳුනාගෙන විශ්වවිද්‍යාලයේ ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම්වලට අදාළව සංවර්ධන වැය විෂයයන්ට බැර කළ යුතු මුදල් ආදායම ලෙස හඳුනාගෙන නොමැති අතර 2023 වර්ෂයේ සිට ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්වල ගැලපීමට කටයුතු කරනු ලබන බව. | ලැබිය යුතු ආදායම් හඳුනා ගෙන මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | විශ්වවිද්‍යාලයට අයත් ගැටඹේ ප්‍රදේශයේ පිහිටි පර්චස් 40 ක පමණ ඉඩමක් 1987 දෙසැම්බර් 31 දින සිට 2017 දෙසැම්බර් 30 දින දක්වා වසර 30 ක කාලයකට බදු පදනම මත දිවිනැගුම දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබුණු අතර ඒ සඳහා 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.7,200,000 ක හිඟ බදු මුදල හා 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ වර්ෂ 05 කාලයකට අදාළව ලැබිය යුතු බදු මුදල් ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | තක්සේරු වාර්තාවක් ලබා ගැනීමෙන් අනතුරුව අය කර ගත යුතු බදු මුදල් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කරන බව. | ආදායම් ගිණුම්ගත කළ යුතු අතර හිඟව පවතින බදු මුදල් අය කර ගත යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයට අදාළව ගෙවන ලද රු.98,104,100ක ශිෂ්‍යා මහපොළ ආධාර ගිණුම්ගත කර නොතිබුණි. | මෙම මහපොළ ආධාර මුදල මූල්‍ය ප්‍රකාශනවල ශිෂ්‍යා මහපොළ ආධාර ලැබීම් හා ගෙවීම් යටතේ ඉදිරි වර්ෂයේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව | වර්ෂයට අදාළ ආදායම්, වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය |
| (උ) | 2022 මැයි 05 දිනැති අංක 09/2022 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව 2022 මැයි 10 දින සිට පරිගණක මෘදුකාංග සියයට 20ක ක්ෂය අනුපාතයක් යටතේ ක්‍රමක්ෂය කළ යුතු වුවත්, සියයට 10 ක ක්ෂය අනුපාතයක් යටතේ ක්‍රමක්ෂය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාලව අස්පෘශ්‍ය වත්කම් රු.2,081,956ක් අඩුවෙන් ක්ෂය කර තිබුණි. ඒ අනුව වර්ෂයේ ඌනතාවය හා අස්පෘශ්‍ය වත්කම් වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි. | නිවැරදි ක්‍රමක්ෂය ප්‍රමාණය 2023 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කරන බව | චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දින වන විට විශ්‍රාම ගිය, සේවය හැර ගිය හා ස්ථාන මාරුවී ගිය නිළධාරීන් 14 දෙනෙකුගෙන් අය විය යුතු රු. 1,372,636 ක ණය ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 10 දක්වා කාලයක් ගත වී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටද අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | එම නිළධාරීන්ගේ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී මෙම ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ණය ශේෂ අය කරගත යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාලයේ දේපල පරිහරණය කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බාහිර පාර්ශවයන්ගෙන් අයවිය යුතු රු.6,879,318 ක් වසර තුනකට වැඩි කාලයක් ගත වී ඇතත්, අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | බාහිර පාර්ශවයන්ගෙන් අයවිය යුතු මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇති බව. | ලැබිය යුතු සියලු ගාස්තු අය කළ යුතුය. |
| (ඇ) | විශ්වවිද්‍යාලයේ පීය 09 කින් 1980 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලයට අදාළව අයවිය යුතු රු. 1,419,396 ක ශාලා ගාස්තු හා දඩ මුදල් වසර 04 ක සිට වසර 42 දක්වා කාලයක් ගත වී තිබුණද, අය කර නොතිබුණි. | ලැබිය යුතු ශාලා ගාස්තු හා දඩ මුදල් ඉදිරි වර්ෂයේදී අය කර ගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු ගාස්තු හා දඩ මුදල් අය කර ගත යුතුය. |

## 1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත | | | |
| | i. 45(XV) වගන්තිය හා 34(3) වගන්තිය | පාලක සභාවේ අනුමැතිය මත විශ්වවිද්‍යාලය වෙනුවෙන් ගිවිසුම්වලට එළඹීමට උපකුලපතිවරයාට බලය ලබාදී ඇතත්,සමාලෝචිත වර්ෂය තුළ කිසිදු ගිවිසුමකට එළඹීමකින් තොරව රු.7,525,000 ක් වූ ව්‍යාපෘති 02 ක් ක්‍රියාත්මක කර තිබුණි. | සේවාලාභී ගිවිසුම් අත්සන් කළ යුත්තේ පාරිසරික අධ්‍යයන මධ්‍යස්ථානය බව, සේවාලාභී ආයතනය වෙත සන්නිවේදනය වීම හේතුවෙන් මෙම තත්ත්වය ඇති වී ඇති බව හා ඉදිරියේදී මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | විශ්වවිද්යාල පනතේ විධිවිධානයන්ට අනුව කටයුතු කළ යුතුය. |
| | ii. 99(ඇ) වගන්තිය | සමාලෝචිත වර්ෂය තුළදී විවිධ අරමුදල් 56 ක් සඳහා ලැබී තිබුණු රු.184,707,847 ක්, සත්ව විද්‍යා හා කෘෂි විද්‍යා ගොවිපල ව්‍යාපෘතිවලින් 2019 - 2021 කාල පරිච්ඡේදය තුළ පිළිවෙලින් ලැබී තිබුණු | මෙම අරමුදල්වලට අදාළ ලැබීම් හා ගෙවීම්, අරමුදලේ ආදායම හා වියදම් ලෙස ගිණුම් ගත කළද භාණ්ඩාගාරය මගින් ලබා දෙනු ලබන ප්‍රතිපාදන ගිණුම් ගත කිරීම නිසි ක්‍රමවේදය අනුවම ගිණුම් ගත කර ඇති බව. | විශ්වවිද්‍යාල පනතේ විධිවිධානයන්ට අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.55,573,606 ක් හා රු.46,398,334 ක් වශයෙන් එකතුව රු.286,679,787 ක් විශ්වවිද්‍යාල අරමුදලට බැර නොකර විවිධ අරමුදල් ගිණුම්වල රඳවාගෙන තිබුණි. | | |
| (ආ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය | | | |
| i. XX වෙනි පරිච්ඡේදයේ 3.1 ඡේදය හා 2017 ජූලි 10 දිනැති 10/2017 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | පැමිණීම හා පිටවීම ඇඟිලි සළකුණු යන්ත්‍රයකින් තහවුරු කර ගැනීමකින් තොරව අධ්‍යයන හා අධ්‍යයන සහායක කාර්යය මණ්ඩලයේ නිළධාරීන් 963 දෙනෙකු සඳහා 2021/2022 වර්ෂවලදී එකතුව රු.6,362,499,051 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා ලබා දෙන නිර්දේශය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට යොමු කර නිශ්චිත ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවීමට ඉදිරියේදී කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන හා පොදු ව්‍යාපාර කාරක සභා නිර්දේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| ii. XXVII වැනි පරිච්ඡේදයේ 1.2.1 ඡේදය | ඉංජිනේරු පීයයේ ජ්‍යෝෂ්ඨ සහකාර ලේඛකාධිකාරීගේ ලිඛිත අනුමැතියකින් තොරව පීයයේ වාහන භාර නිළධාරිවරයා විසින් සමාලෝචිත වර්ෂයේ ජූනි 11 දින රියදුරු සහ රිය සහයකවරයෙකු සහිතව වාහනයක් සති අන්ත දිනයක රාජකාරියෙහි යොදවා එම වාහනය ඇතුළුව තවත් වාහන 04 ක් අනතුරකට ලක්කර රු.5,443,615 ක පමණ අලාභයක් සිදු කර තිබුණි. | එම වාහන අනතුරු සම්බන්ධයෙන් ප්‍රාරම්භක පරීක්ෂණ අවසන් කර විධිමත් පරීක්ෂණයකට අදාළ කටයුතු කරමින් පවතින බව. | වාහන සම්බන්ධ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතු අතර පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කර වගකිව යුතු නිළධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| i. 2.8.1 (b), 7.2.1 හා 7.6.1(a) මාර්ගෝපදේශ | 2022 වර්ෂයේ උපාධි ප්‍රදානෝත්සවයට අදාළ ඡායාරූප ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී මාර්ගෝපදේශවලට අනුගත නොවී විශේෂඥ දැනුම ඇති පුද්ගලයකු තාක්ෂණික ඇගැයීම් කමිටුවට පත් නොකර වඩාත් සුදුසුකම් ලැබූ ටෙන්ඩර්කරු තාක්ෂණික ඇගයීම් කමිටුවට බලපෑම්කළ බව දක්වා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් ඉවත් කර විනිවිධභාවයකින් හා රහස්‍යභාවයකින් තොරව | විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් හට නියමිත වේලාවට නියමිත පරිදි සේවය සැපයීමේ අරමුණින් රටේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් පැන නැගුණු සියලු කරුණු සලකා බලා අවම මිල ගණන් යටතේ ප්‍රසම්පාදනය කර ඇති බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | වෙනත් තෝරාගත් ටෙන්ඩර්කරුවන් දෙදෙනෙකු වෙත ටෙන්ඩරය පිරිනමා රු.3,458,980 ක් ගෙවා තිබුණි. | | |
| ii. | 2.14.1 මාර්ගෝපදේශය | නවක වදය සම්බන්ධ සිසුන් අතර හට ගත් ආරවුලක් හේතුවෙන් ශාස්ත්‍ර පීඨයේ භෝජනාගාරය සහ ඒ අවට සීසීටීවී (CCTV) කැමරා පද්ධතියක් සවි කිරීම සඳහා ප්‍රසම්පාදන පරිපාටියෙන් බැහැරව කටයුතු කර ඒ සඳහා රු.1,122,400 ක් ගෙවා තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 ප්‍රකාරව ඉතා හදිසි කටයුත්තකදී නිශ්චිත ටෙන්ඩර් ක්‍රියා පරිපාටියකින් බැහැරව කටයුතු කළ හැකි බව දක්වා ඇති බැවින් සිසුන්ගේ ජීවිත අවදානමෙන් මුදවා ගැනීමේ අරමුණින් මෙම සීසීටීවී සවි කිරීම සිදු කළ බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතුය. |
| iii | 7.9 මාර්ගෝපදේශය | සමාලෝචිත වර්ෂය සඳහා සත්ව ආහාර මිලදී ගැනීමේදී එම සත්ව ආහාරවල පෝෂ්‍ය පදාර්ථ සංයුතිය පිළිබඳව විස්තරාත්මකව ලංසු ඇගැයීමකට ලක් නොකර තාක්ෂණික ඇගැයීම් කමිටු නිර්දේශ මත සත්ව ආහාර මිලදී ගැනීම සඳහා සැපැයුම්කරුවන් දෙදෙනෙකුට රු.15,568,000 ක් ගෙවා තිබුණි. | සත්ත්ව ආහාර පිළිබඳ බලපත්‍රයක් සහිත සැපයුම්කරුවන්ගෙන් පමණක් මිලදී ගැනීම සිදු කරන අතර තාක්ෂණ කමිටුව ලංසු ඇගැයීමේදී මේ පිළිබඳ විශේෂ සැලකිල්ලක් දක්වන බව හා ආහාර සාම්පල පරීක්ෂා කිරීම ප්‍රායෝගිකව අපහසු බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 13.5 සහ 13.7 ඡේදයන්ද, විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ III වන පරිච්ඡේදයේ 23.3.7 ඡේදය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 09/2015 හා 06/2014 දරන චක්‍රලේඛ | විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී තනතුරේ රාජකාරි ආවරණය කිරීමේ පදනමින් පත් කර තිබුණු නියෝජ්‍ය ලේඛකාධිකාරීවරියට ආයතන සංග්‍රහයේ සහ චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව කටයුතු කරමින් 2021 ජනවාරි සිට 2023 පෙබරවාරි දක්වා ඉන්ධන හා ප්‍රවාහන දීමනා ලෙස රු.1,364,670 ක මුදලක්ද, විනෝදාස්වාද දීමනා (Entertainment Allowances) ලෙස රු.270,400 ක මුදලක්ද ගෙවා තිබුණි. | ලේඛකාධිකාරී තනතුරේ වැඩ ආවරණය කිරීමේදී කාන්තාවක ලෙස රාජකාරියෙහි නියුක්ත වීමේදී ඇයට ප්‍රවාහන පහසුකම් සැපයීම අත්‍යාවශ්‍ය වන නිසා විශ්වවිද්‍යාලය මඟින් රාජකාරී වාහනයක් ලබා දීමේදී දැරීමට සිදු වන පිරිවැය සළකා බලා ප්‍රවාහන දීමනාව ගෙවීම වඩා වාසිදායක බව හා රාජකාරී අවශ්‍යතාවය මත විනෝදාස්වාද දීමනා ගෙවා ඇති බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන හා චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ හා අදාල විෂය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව පශ්‍ | 2021 වර්ෂයේ ආරම්භ කරන ලද සහ අළුත් කරන ලද ස්ථාවර තැන්පතු සඳහා මුදල් ඇමතිවරයාගේ අනුමැතියට | මුදල් පනතේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | වෛද්‍ය පීඨයේ ගොවිපල ව්‍යාපෘතිය තුළින් ලැබී තිබුණු රු.14,097,000 ක් සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කර තිබුණි. | යොමු කර ඇති බව. | |
| (ඊ) | 1989 ජූලි 24 දිනැති අංක 09/1989 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ආයතනික චක්‍රලේඛය මඟින් අනුමත කර තිබුණු අංක 24/89 හා 1989 මාර්තු 31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.7 ඡේදය | යම් නිලධාරියෙකු සේවයේ ස්ථිර කිරීම සඳහා අධ්‍යාපන හෝ වෙනත් සහතික සනාථ කර ගැනීම අවශ්‍ය වන කල්හි, ඔහුගේ පරිවාස කාලය අවසන් වන තෙක් නොසිට පත් කිරීමෙන් පසු හැකි තාක් ඉක්මණින් එම කටයුතු නිම කළ යුතු බවට දක්වා තිබුණද, ව්‍යාජ සහතික ඉදිරිපත් කර තිබුණු අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සේවකයින් දෙදෙනෙකුගේ සුදුසුකම් මාස 06 ක කාල සීමාව තුළ සනාථ කර නොගෙන එකී මාස 06 ඉක්මවා වසර 04 ක් දක්වා එකතුව රු.4,904,233 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | එක් සේවකයෙකු වෙත ගෙවන ලද වැටුප අය කර ගැනීම සම්බන්ධයෙන් පාලක සභාව වෙත යොමු කර ඇති අතර අනිත් සේවකයාගේ ප්‍රතිඵල මේ දක්වා සනාථ කර ලැබී නොමැති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (උ) | 2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | පර්යේෂණ කළමනාකරණ කමිටු අනුමැතියකින් තොරව හා කිසිදු අන්තර් පර්යේෂණ වාර්තාවක් හෝ අවසන් පර්යේෂණ වාර්තාවක් හෝ ලබා ගැනීමකින් තොරව අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ නිලධාරීන් 59 දෙනෙකු සඳහා 2014 නොවැම්බර් 01 දින සිට 2022 අගෝස්තු 31 දින දක්වා කාලය තුළ රු.83,739,907 ක පර්යේෂණ දීමනා ගෙවා තිබුණි. | වර්තමානයේදී පර්යේෂණ කළමණාකරන කමිටුවේ අනුමැතිය මත පර්යේෂණ දීමනා ගෙවීම කරනු ලබන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඌ) | 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | | | |
| | i. 4.5 ඡේදය | විශ්වවිද්‍යාලයේ 2018 ජනවාරි 01 දින සිට 2021 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ ක්‍රියාත්මක කර තිබුණු අයවැයගත වටිනාකම | ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම්වල කටයුතු අවසන් වූ පසු වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට නියමිත බව. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | රු.354,379,267 ක ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් 225 ක් හා විගණනයට ඉදිරිපත් නොකරන ලද ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් 142 ක් නිම කළ යුතු අවම කාල සීමාව ඉක්මවා තිබුණු නමුත් ඒ සම්බන්ධයෙන් පිළියෙල කළ යුතු වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. | | |
| | ii. | 5.1.4 ඡේදය | 2018 ජනවාරි 01 දින සිට 2022 ජූලි 31 දක්වා කාලය තුළ ක්‍රියාත්මක කර තිබුණු ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම්වලට අදාළ රු.21,794,855 ක මුදලක් විශ්වවිද්‍යාලයේ සංවර්ධන වැය ශීර්ෂයට බැර නොකර පීඨ හා දෙපාර්තමේන්තුවල විවිධ අවශ්‍යතාවන් සඳහා අනුමැතියකින් තොරව වියදම් කර තිබුණි. | 383 හා 387 වන විශ්වවිද්‍යාල මුදල් කමිටු තීරණයන් හා චක්‍රලේඛයේ 5.1.6 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව අනුමත අයවැය ලේඛනවල 5.1.4 යටතේ සඳහන් මුදල පීඨයේ අවශ්‍යතා සඳහා වියදම් කර ඇති බව. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | iii. | 5.1.4, 5.2.1 හා 5.2.2 යන ඡේද | සංවර්ධන වැය විෂයයන් සඳහා වෙන් කරන ලද දායක මුදල් විශ්වවිද්‍යාල අරමුදලට බැර කළ යුතු බවට දක්වා ඇතත්, විශ්වවිද්‍යාලයේ 2018 ජනවාරි 01 දින සිට 2022 ජූලි 31 දින දක්වා ක්‍රියාත්මක කරන ලද ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් 213 කට අදාළව රු.196,103,699 ක දායක මුදලක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විශ්වවිද්‍යාල අරමුදලට බැර කර නොතිබුණි. | 04/2016 චක්‍රලේඛයේ සඳහන් සංවර්ධන වැය විෂයයන් සඳහා දායක මුදල් අදාළ අරමුදල්වලට බැර කරනු ලබන්නේ එම ක්‍රියාකාරකම අවසන් කර ඒවායේ මූල්‍ය ප්‍රකාශන මුදල් කමිටුව වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (එ) | 2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/214 / 19/2023 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | | සමාලෝචිත වර්ෂය අවසානයට බැදුම්කර හා ගිවිසුම් කඩ කරන්නන්ගෙන් අය කර තිබුණු එකතුව රු.747,751,824 ක් භාණ්ඩාගාරයට මාරු කර නොතිබුණි. | විගණන විමසුමෙහි සඳහන් චක්‍රලේඛය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මේ දක්වා අන්තර්ග්‍රහණය කර නිකුත් කර නොමැති බව. | භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.77,582,289 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ රු.620,220,964 ක අතිරික්තයක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.697,803,253 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පෞද්ගලික පඩිනඩි වියදම්, සැපයුම් සේවා වියදම්, ගිවිසුම් සේවා වියදම් හා වෙනත් පුනරාවර්තන වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරුත්තාපන ව්‍යාපෘති 08 කට අදාළව වැඩ ආරම්භ කිරීමට ගෙවා තිබුණු රු.33,827,177 ක හා ප්‍රාග්ධන ව්‍යාපෘති 04 කට ගෙවා තිබුණු රු.11,982,808 ක සංචලන අත්තිකාරම් ගෙවා වසර 02 සිට වසර 10 ක කාලයක් ගත වී තිබුණද, එම අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සම්පූර්ණ අත්තිකරම් මුදල අයකර ගැනීමට කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව අත්තිකාරම් මුදල් අය කර ගත යුතුය. |
| (ආ) | මූලික විමර්ශන වාර්තාව අනුව විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය යටතේ ගැනෙන වරදක් බැලූ බැල්මට සිදු කර තිබුණු හෙයින් හිටපු රෙජිස්ට්‍රාර්වරයාගේ වැඩ තහනමට ලක් කළ හැකිව තිබියදී එසේ නොකර අනිවාර්යය නිවාඩු යවා පසුව නීතිපතිවරයාගේ මතය විමසා ඒ අනුව විධිමත් පරීක්ෂණයක් නොකර ඔහුගේ සේවය අවසන් කිරීම යන නොසැලකිලිමත් හා වැරදි කළමනාකරණ තීරණ හේතුවෙන් විශ්වවිද්‍යාලය වෙත කිසිදු සක්‍රීය දායකත්වයක් ලබාදී නොතිබියදී රු.6,393,354 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවන ලද වැටුප අයකර ගැනීමට තීරණය කර ඇතත්, 2023 මාර්තු 30 දින අභියාචනාධිකරණයේ එකඟතාවය පරිදි වැඩිපුර ගෙවන ලද වැටුප අය කිරීම තාවකාලිකව අත්හිටුවා ඇති බව. | ගෙවන ලද වැටුප සම්බන්ධව වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | බැඳුම්කර හා ගිවිසුම් කඩ කරන ලද ආචාර්යවරුන් හා අනිකුත් නිළධාරීන් 122 දෙනෙකුගෙන් වසර 02 සිට වසර 52 දක්වා කාලයකට අදාළව සමාලෝචිත වර්ෂය අවසන් දින වන විට අයවිය යුතු රු. 240,944,708 ක් එම ආචාර්යවරුන්ගෙන් හා නිළධාරීන්ගෙන් අය කර ගැනීමට විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. | මෙම නිළධාරීන්ගේ අර්ථසාධක අරමුදල්වල ශේෂයන් සහ බැඳුම්කර වටිනාකම්වල ශේෂයන් ගණනය කර අදාළ අය කිරීම් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් කිරීමට නියමිත බව. | අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වැටුප් රහිත නිවාඩු ලබා සිට හා සේවය හැර ගොස් සිටි පරිවාස කාලයේ පසුවන බැදුම්කර කඩ කරන ලද කථිකාචාර්යවරුන් 04 දෙනෙකු සඳහා රු.2,125,975 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. | අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙන බව | අයකර ගැනීමට කටයුතු කළ යුතුය |
| (ඉ) | විශ්වවිද්‍යාලයීය ඉංජිනේරු නිර්මාණ මධ්‍යස්ථානයෙන් උපදේශන සේවා කටයුතු ඉටු කරවා නොගෙන 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාල පරාසය තුළ ඉදිකිරීම් කොන්ත්‍රාත් 03 ක උපදේශන සේවා බාහිර ආයතනවලින් ලබාගෙන රු.4,539,029 ක් ගෙවා තිබුණි. | ඉන්ජිනේරු පීඨයේ පීඨාධිපති වෙත ලංසු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් උපදෙස් ලබා දී ඇති බව. | විශ්වවිද්‍යාල ඉංජිනේරු නිර්මාණ මධ්‍යස්ථානයෙන් උපදේශන සේවා ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48 ව්‍යවස්ථාව ප්‍රකාරව මූල්‍ය පාලනය පිළිබඳ උත්තරීතර බලය පිළිබඳ වගවීමේ කාර්යභාර්ය සම්බන්ධයෙන් කටයුතු කරණු ලබන විගණන හා කළමනාකරණ කමිටු වෙත නිසි හා නියමිත පරිදි කැඳවා තිබියදීත් 2022 හා 2023 වර්ෂයන්වලදී විශ්වවිද්‍යාලය පවත්වන ලද 98,99 හා 100 වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සඳහා අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ විධායක නිළධාරීන් පිළිවෙලින් 17 දෙනෙක්, 11 දෙනෙක් සහ 13 දෙනෙක් සහභාගීවීම පැහැර හැර තිබුණි. | එම නිළධාරීන් වෙත කරුණු විමසීමේ ලිපියක් නිකුත් කර ඇති අතර එම කරුණු විමසීමේ ලිපියේ අඩංගු කරුණු සලකා බැලීමෙන් අනතුරුව එම නිළධාරීන් සම්බන්ධයෙන් ගතහැකි විනය ක්‍රියාමාර්ග තීරණය කිරීමට විශ්වවිද්‍යාල පාලක සභාවට යොමු කිරීමට කටයුතු කරනු ලබන බව. | මූල්‍ය වගවීමේ කාර්යය භාරය පැහැර හැරීම පිළිබඳ පොදු ව්‍යාපාර සහා කමිටු නිර්දේශය ක්‍රියාත්මක කළ යුතුය. |
| (උ) | 2003 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා පුනරුත්තාපන හා ප්‍රාග්ධන ව්‍යාපෘති වෙනුවෙන් වැය කර තිබුණු එකතුව රු.411,628,504කට අදාල ව්‍යාපෘති වැඩ අවසන් නොකර අතහැර දමා තිබුණද ඊට වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන එම මුදල් අය කිරීමට හෝ පොත්වලින් ලියා හැරීමට හෝ කටයුතු නොකර අඛණ්ඩව නොනිමි වැඩ යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | බිල්පත් නිරාකරණය නොවීම හා ව්‍යාපෘති අතර මහ නවතා දැමීම හේතුවෙන් එම ව්‍යාපෘති ප්‍රාග්ධනිත කිරීමට නොහැකි වී ඇති බව. | වගකිව යුතු නිළධාරීන්ගෙන් අය කිරීම හෝ පොත්වලින් ලියා හැරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.40,467,077ක් වූ පර්යේෂණ අරමුදල් 35කින් පර්යේෂණ අරමුදල් 01 කට අදාළ රු.14,963,744 ක් වසර 05 කට වැඩි කාලයක සිටද, පර්යේෂණ අරමුදල් 19 කට අදාළ රු.14,004,909 ක් වසර 01 සිට වසර 05 දක්වා කාලයක සිටද, පර්යේෂණ අරමුදල් 15 කට අදාළ රු.11,498,424 ක් වසරක කාලයක සිටද ඌන උපයෝජිතව තිබුණි. | 2022 වර්ෂයේ දී මෙම අරමුදල යටතේ ගෙවීම් සඳහා ඉල්ලුම් කිරීමක් සිදු වී නොමැති බව. | අරමුදල් ඵලදායීව උපයෝජනය කළ යුතුය. |

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඇස්තමේන්තු වටිනාකම රු.85,105,000 ක් වූ පශු වෛද්‍ය පීඨයේ ගොවිපළ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල වැඩි දියුණු කිරීමේ කර්මාන්තය ගිවිසුම් ප්‍රකාරව 2019 නොවැම්බර් 01 දින වන විට අවසන් කළයුතු වුවත්, 2022 මාර්තු 31 දක්වා අවස්ථා 06 කදී කාලය දීර්ඝ කිරීම් ලබාගෙන සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් ඉදිකිරීම් කාර්යය අවසන් කර නොතිබුණි. | අර්බුදකාරී ආර්ථික වාතාවරණය හේතුවෙන් ප්‍රමාද වී ඇති බව හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව අනුමැතිය ලබාගෙන 2022 නොවැම්බර් 30 දක්වා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර ඇති බව. | කඩිනමින් ඉදිකිරීම් කාර්යය අවසන් කළ යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාලයේ මී වතුර නේවාසිකාගාර පරිශ්‍රයේ ආපනශාලාවක් ඉදිකිරීම වෙනුවෙන් රු.36,815,177 ක ඇස්තමේන්තුගත වටිනාකමකට 2021 ඔක්තෝබර් 01 දින කොන්ත්‍රාත්කාර ආයතනයක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණු අතර 2022 සැප්තැම්බර් 30 දින වන විට මෙම කර්මාන්තය නිම කර භාරදිය යුතු විය. එහෙත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉදිකිරීම් කටයුතුවලින් සියයට 19 ක් පමණක් නිමකර තිබුණ අතර රු.4,874,908ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබියදී කොන්ත්‍රාත්කරු විසින් ඒක පාර්ශවිකව කොන්ත්‍රාත්තුවේ වැඩ තාවකාලිකව නතර කර දමා තිබුණි. | ව්‍යාපෘතිය නිම කිරිමට අදාළ උපදෙස් කොන්ත්‍රාත්කරු වෙත ලබා දී ඇති බව. | ව්‍යාපෘතියේ කටයුතු නැවත ආරම්භ කර කඩිනමින් නිම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිර්දේශයකින් තොරව හා අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත් බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැළකිල්ලෙන් තොරව ඉංජිනේරු පීඨයේ පීඨ මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ පාදම ඉදිකිරීම වෙනුවෙන් 2018 වර්ෂයේදී රු.15,995,157 ක් වැය කර වසර 05 ක කාලයක සිට ඉදිකිරීම් අත්හැර දමා තිබීම හේතුවෙන් ඊට අදාළ වැය කිරීම් අනාර්ථික වියදමක් වී තිබුණි. | ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශ ලබා දී ඇති බව හා අදියර දෙකකින් යුත් මෙම කාර්යේ පළමු අදියර පමණක් 2021 අගෝස්තු 02 නිම කර ඇති බව. | අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත් බව හා අවංකභාවයෙන් යුතුව රාජ්‍ය මුදල් වැය කළ යුතුය. |